# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2146/22 - 2019 ඔක්තෝබර් මස 22 වැනි අඟහරුවාදා - 2019.10.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 3 වන සංශෝධනය

### ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ සේවා ව්‍යවස්ථාව

අංක 1880/26 හා 2014 සැප්තැම්බර් මස 19 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද සහ අංක 1971/17 හා 2016 ජුනි මස 15 වැනි දිනැති හා අංක 2032/33 හා 2017 අගෝස්තු මස 17 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍ර* මඟින් සංශෝධිත ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලබන අතර මෙම සංශෝධිත විධිවිධානයන් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණය ගනු ලැබූ 2019 පෙබරවාරි මස 26 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

**එම්. ඒ. බී. දයා සෙනරත්,**
ලේකම්.
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2019 ඔක්තෝබර් මස 04 වැනි දින.

10.1.1.1

ii. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හය (06) ක් උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

1A - G 031321 - 10 (2019/10)
මෙම *අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

10.2.1

i. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06) ක සක්‍රීය හා සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හය (06) ක් උපයාගෙන තිබීම.

iv. අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) ක් තුළ සතුටුදයක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

**10.2.1 යටතේ සඳහන් සුදුසුකම් වලට පහළින් පහත සටහන ඇතුළත් කරනු ලැබේ.**

**සටහන**

අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණය ගනු ලැබූ 2019 පෙබරවාරි මස 26 වැනි දිනට II ශ්‍රේණියට උසස්වීමට නියමිත සංශෝධිත 10.1.1.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරින් සහ එදිනට පෙර II ශ්‍රේණියට උසස්වී ඇති නිලධාරින්, III හා II ශ්‍රේණිවල වසර 12 ක සක්‍රීය හා සතුටුදයක සේවා කාලයක් සහ 10.2.1 i. හි සඳහන් සුදුසුකම හැර 10.2.1 යටතේ සඳහන් අනෙකුත් සියළුම සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනයේ සිට I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

11-724

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.